ශ්‍රී බෝධිරාජ ධර්මායතනය
Sri Bodhiraja Bhikkhu Training Centre
SRI BODHIRAJA FOUNDATION
(Incorporated by the Parliamentary Act No. 30 of 1993)
හිගුරආර - ඇඹිලිපිටිය Embilipitiya, Sri Lanka, 70200.
Tel: 047 2 261 399 / 0474 931 725 / 0713 930 088 Email: omalpe26@gmail.com
Fax: 0474 931 682 Web: sbf.lk

2570/2026.10.06

ගරු ලේකම් ස්වාමීන් වහන්සේ,

බුද්ධ ශාසන මණ්ඩලය.

ගරු ලේකම් ස්වාමීන් වහන්ස,

වර්තමානයේ මහා පරිමාණ වශයෙන් පැතිර යමින් පවත්නා බෞද්ධ විරෝධී ක්‍රියාකාරකම් අරභයා සුදුසු පියවර ගැනීමේ පරමාර්ථයෙන් පිහිටුවන ලද බුද්ධ ශාසන මණ්ඩලය මේ දක්වා සිදුකරන ලද විසඳුම් දායක පියවර මොනවාද යන්න ගැන රටේ ජනතාව දැනුවත් නැත. අඩුම වශයෙන් නිකාය සංඝ සභාවත් එම මණ්ඩලය මගින් සිදුවන දේ පිළිබඳ කිසිදු අවබෝධයක් නැත. ඒ සම්බන්ධයෙන් මෙන්ම, මේ දිනවල බරපතළ ආකාරයෙන් පැන නැගී ඇති පහත සඳහන් කරුණු පිළිබඳ බුද්ධ ශාසන මණ්ඩලය මගින් ගන්නා ලද හෝ ගැනීමට බලාපොරොත්තු වන විසඳුම් මොනවාද යන්න ගැන අපව දැනුවත් කරන ලෙස ඉල්ලමි.

1. සිරගත කරන ලද ගලගොඩඅත්තේ ඥාණසාර හිමියන්ගේ සිවුර ඉවත් කිරීම හා සම්බන්ධ ප්‍රශ්නය.
2. කැකිරාවේ සුදස්සන නමැත්තාගේ ධර්මවිරෝධී හැසිරීම් රටාව පිළිබඳ ප්‍රශ්නය.
3. තිත්තගල්ලේ ආනන්ද සිරි නමැත්තා ශාසන විරෝධී ආකාරයෙන් අලුතින් නිකායක් ආරම්භ කරන බවට මහානායක මාහිමිවරුන්ට සෘජු ලෙසම අභියෝග කරමින් සිදුකරන ලද තර්ජනාත්මක හැසිරීම පිළිබඳ ප්‍රශ්නය.
4. ක්‍රිස්තියානි ධර්මය අදහන අයට මිථ්‍යාදෘෂ්ඨික යන යෙදුම මින් ඉදිරියට පාවිච්චි කළ හොත් එයට විරුද්ධව නීති මගින් ක්‍රියා කරන බවට ජෙරම් ප්‍රනාන්දු ඇතුළු බෝරන් එකේ කණ්ඩායමක් සිදුකරන තර්ජනය පිළිබඳ ප්‍රශ්නය.
5. ක්ලිප්පේ අරියමග්ග නමැති අය ප්‍රධාන පිරිසක් විසින් පිහිටුවන ලදැයි ප්‍රකාශිත "සිරි ගොතම සම්බුද්ධ නිකාය" යන නව සංවිධානය සම්බන්ධ ප්‍රශ්නය.
6. "බුදුරදුන් ශ්‍රී ලංකාවේ උපන්නේය හා වර්තමාන සම්භාවිත ත්‍රිපිටකය බොරුවක් ය" යනුවෙන් මීවනපලානේ ධර්මාලංකාර නමැත්තා ප්‍රධාන කණ්ඩායම විසින් කරනු ලබන මිථ්‍යාදෘෂ්ඨික ප්‍රකාශය පිළිබඳ ප්‍රශ්නය.
7. "භික්ෂු සමාජය හා බුද්ධ සාසනය සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළු විසඳීම සඳහා කළයුතු දේ ගැන මහානායක මාහිමිවරු අපට උපදෙස් දෙන්න. අවශ්‍ය නම් නීති සංශෝධනය කර දෙන්නම්. අවශ්‍ය නම් අළුතින් නීති සම්මත කර දෙන්නම්." යනුවෙන් ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමන් 2026.05.27 දින වෙසක් සතිය උත්සව අවස්ථාවේ කරන ලද අතිශය වැදගත් ප්‍රතිඥාව සම්බන්ධයෙන් මේ දක්වා කිනම් ආකාරයේ පියවරක් ගන්නා ලද්දේ ද යන ප්‍රශ්නය.

තෙරුවන් සරණයි !

මෙයට,

පූජ්‍ය ඕමල්පේ සෝභිත ස්ථවිර
ශ්‍රී බෝධිරාජ ධර්මායතනය
හිගුරආර ඇඹිලිපිටිය.

පූජ්‍ය ඕමල්පේ සෝභිත ස්ථවිර

පිටපත් :-

- ත්‍රෛනිකායික අති පූජ්‍ය මහානායක මාහිමියන් වහන්සේලා
- අතිගරු ජනාධිපති තුමා